## 2024-12-23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. බහුආංශික ප්‍රදාන ආධාර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම**

සමාජ-ආර්ථික සංවර්ධනය සහ ද්විපාර්ශ්වික සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම් රාමුවක් අත්සන් කිරීමට යෝජිතව ඇත. එම අවබෝධතා ගිවිසුම් රාමුවට අනුව, ඉන්දීය රජය විසින් සපයනු ලබන ශ්‍රී ලංකා රුපියල් මිලියන 2,371.83ක ප්‍රදාන ආධාර යටතේ නැගෙනහිර පළාත තුළ සංවර්ධන ව්‍යාපෘති මාලාවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. ඒ යටතේ අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම, ධීවර, සංචාරක සහ ප්‍රජා සවිබලගැන්වීම යන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් යටිතල පහසුකම් සංවර්ධනයට හා ජීවනෝපාය වැඩිදියුණු කිරීමට අදාළව ව්‍යාපෘති 33ක් ක්‍රියාත්මක කිරීම පිණිස හඳුනාගෙන ඇත. ඒ අනුව, යෝජිත අවබෝධතා ගිවිසුම් රාමුවට දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම**

පාර්ශ්වයන්ට ක්‍රියාකාරකම් වර්ධනය කර ක්‍රියාත්මක කළ හැකි සහයෝගිතා වැඩ රාමුවක් සැපයීමටත්, පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් අන්‍යොන්‍ය ප්‍රතිලාභ සඳහා පහසුකම් සැලසීමටත් හැකි වන පරිදි එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය (UNITAR) සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය අතර වසර 03ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී ඇත. එකී අවබෝධතා ගිවිසුම යටතේ විශේෂයෙන්ම තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාළව පුහුණු සහ ඉගෙනුම් සහාය, රාජ්‍යතාන්ත්‍රිකයින් පුහුණු කිරීම, ආපදා අවදානම අවම කිරීම සහ අර්බුද කළමනාකරණය හා භූ-තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳව පුහුණු කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, දෙපාර්ශ්වය අතර යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල ජෛවවිවිධත්වය පිළිබඳ ගිවිසුම**

ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්වය පිළිබඳ අන්තර් රාජ්‍ය සමුළුව විසින් ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල ජෛව විවිධත්වය පිළිබඳ ගිවිසුම 2023-06-19 දින සම්මත කරනු ලැබ ඇත. එම ගිවිසුම සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) යටතේ ක්‍රියාත්මක වන තුන්වන ගිවිසුම වේ. සංවර්ධිත රටවල මිනිස් ක්‍රියාකාරකම් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස සාගර ජෛව විවිධත්වය තර්ජනයට ලක් වී ඇති අතර, එමඟින් සාගර ගුණාත්මකභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව අවදානමට ලක් වී ඇත. සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම, විවිධ පාර්ශ්වකරුවන්ගේ පුළුල් සහයෝගිතාව සහ සම්බන්ධීකරණය තුළින් විශාල භූගෝලීය ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම යන කරුණු පදනම් කර ගනිමින් එකී ගිවිසුමට එළඹීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල ජෛවවිවිධත්වය පිළිබඳ ගිවිසුම අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සිදු වූ හානි හා වන්දි ගෙවීමේ වැඩපිළිවෙළ**

පසුගිය දිනවල පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් බොහෝ දිස්ත්‍රික්කවල නිවාස, මහාමාර්ග, කුඹුරු හා වගා භූමි ජලයෙන් යට වීමත්, වැව්අමුණු හා ඇළවේලි විශාල ප්‍රමාණයක් කැඩී යාමත් හේතුවෙන් මහජනතාවට විවිධ අපහසුතාවන්ට මුහුණ පෑමට සිදු විය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව 2024-12-02 දින වන විට දිවයින පුරා දළ වශයෙන් කුඹුරු අක්කර 91,300ක් පමණ පූර්ණ හානියට පත් වී ඇති අතර, කුඹුරු අක්කර 86,225ක් පමණ අර්ධ හානියට ලක්ව ඇත. ඊට අමතරව, සුළු වාරිමාර්ග 173ක් පූර්ණ වශයෙන් විනාශ වී ඇති අතර, 1,148කට අර්ධ වශයෙන් හානි සිදු වී තිබේ. එසේම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක් එළවළු වගා අක්කර 750ක් පමණ විනාශ වී ඇති බවට වාර්තා වී ඇත. තවද, හානියට පත් කුඹුරුවල නැවත මාස 2 1/2 හෝ මාස 3 වී ප්‍රභේදයන් හෝ සුදුසු කෙටිකාලීන භෝගයන් වගා කිරීම සඳහා අවශ්‍ය බීත්තර වී සහ බීජ සපයා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරමින් සිටී. පවතින වගා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වී

වගාව සඳහා උපරිම වශයෙන් හෙක්ටයාර 02ක් (අක්කර 05ක්) දක්වා අක්කරයකට උපරිම වශයෙන් රුපියල් 40,000/-ක හානිපූරණයක් ද, එසේම, බඩඉරිඟු, අර්තාපල්, මිරිස්, ලොකුලූණු සහ සෝයා බෝංචි යන භෝග වර්ග 05 සඳහා උපරිම වශයෙන් හෙක්ටයාර 01ක් (අක්කර 2.5ක්) දක්වා අක්කරයකට උපරිම වශයෙන් රුපියල් 40,000/-ක හානිපූරණයක් ද, 2025 වර්ෂය සඳහා කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදනවලින් ලබා දීමට ඉදිරියේදී කටයුතු සිදු කරනු ලබන බව සඳහන් කරමින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

05. **සහල් ආනයනය/ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය**

දේශීය වෙළෙඳපොළේ පවතින සහල් හිඟය හේතුවෙන් 2024-12-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබා දෙන ලද අනුමැතිය පරිදි සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් සහල් මෙට්‍රික්ටොන් 70,000ක් ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එසේම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් තොරව 2024-12-20 දින දක්වා සහල් ආනයනය කිරීම පිණිස පෞද්ගලික අංශයේ ආනයනකරුවන්ට ද අවසර ලබා දී ඇත. දේශීය වෙළෙඳපොළේ පවතින සහල් හිඟය 2025 ජනවාරි මස අවසානය දක්වා පැවතීමට ඉඩ ඇති බව නිරීක්ෂණය වී තිබේ. ඒ අනුව, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් තොරව පුද්ගලික අංශයේ ආනයනකරුවන්ට සහල් ආනයනය කිරීම සඳහා අවසර ලබා දී ඇති කාලසීමාව 2025-01-10 දින තෙක් දීර්ඝ කිරීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කරමින් චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහිලා එම ආයතන සතු වගකීම ඉටු කිරීම**

2024-12-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති පරිදි "Clean Sri Lanka"වැඩසටහනට අනුගතව, තිරසර නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය උදෙසා ප්‍රජා සහභාගිත්වය මෙන්ම ප්‍රජා දැනුම්වත්භාවයෙහි ඇති වැදගත්කම හඳුනාගනිමින් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා සියලුම පුරවැසියන්ට

හා පළාත් පාලන ආයතනවලට ඇති වගකීම හා බැඳීම තහවුරු කිරීම අරමුණු කර ගනිමින්, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සැලසුම් කර ඇත. ඒ අනුව, පළාත් පාලන බල ප්‍රදේශ පදනම් කර ගනිමින් යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්යසාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම සඳහා වන ව්‍යාපෘතිය**

පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායම් ප්‍රභව ශක්තිමත් කරමින් මහා භාණ්ඩාගාරයට සිදු කරනු ලබන වැය බර අවම කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුන්වා දීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සියලුම පළාත් පාලන ආයතනවල කාර්යසාධනය මැන බැලීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ සියලුම පළාත් පාලන ආයතනවල කළමනාකරණය, සේවා සැපයීම, පාලන ක්‍රමවේද සහ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දක්වා ඇති දායකත්වය යන ක්ෂේත්‍ර ආවරණය කරමින් 2022 හා 2023 වසරවල කාර්යසාධනය මැන බැලීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර තිබේ. විශේෂයෙන්ම, ප්‍රාදේශීය සභා විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන්වල ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය ප්‍රදේශ අනුව සිදුවන විෂමතා හේතුවෙන් උච්චාවචනය වන බව එකී කාර්යසාධන ඇගයීමේදී නිරීක්ෂණය වී ඇත. එම ඇගයීමේදී හඳුනාගත් ශක්තීන් හා දුර්වලතා ආශ්‍රයෙන් මධ්‍යකාලීන තිරසර වැඩපිළිවෙලක් ලෙස 2025-2027 වර්ෂයන් සඳහා තෝරාගත් ප්‍රාදේශීය සභාවලට ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිසත්, ඒ යටතේ 2025 වර්ෂයේදී එක් පළාතකින් ප්‍රාදේශීය සභා 06ක් බැගින් ප්‍රාදේශීය සභා 54ක් හඳුනාගෙන, එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම පිණිසත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **2025-04-01 දින සිට 2025-08-31 දින දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 06ක් මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

2025-04-01 දින සිට 2025-08-31 දින දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 06ක් මිල දී ගැනීම පිණිස ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 06ක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව M/s Aditya Birla Global Trading (Singapore) Pte. Ltd වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පහත සඳහන් නියමයන් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

- අංක 2384/31 දරන 2024-05-17 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන වගන්තිය යටතේ වන නියමය.

* අංක 2395/32 දරන 2024-07-31 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන හා 5වන වගන්ති යටතේ වන නියමය.

* අංක 2404/19 දරන 2024-10-02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන වගන්තිය යටතේ වන නියමය.

* අංක 2406/02 දරන 2024-10-14 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන සහ 5වන වගන්ති යටතේ වන නියමය.

අංක 2408/15 දරන 2024-11-01 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන වගන්තිය යටතේ වන නියමය.

* අංක 2412/38 දරන 2024-11-30 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන වගන්තිය යටතේ වන නියමය.

10. **1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත පරිච්ඡින්න කිරීම**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත මේ වන විට අවස්ථා 08කදී සංශෝධනය කරනු ලැබ ඇති අතර, එකී පනත පරිච්ඡින්න කර නව පනතක් හඳුන්වා දීම සඳහා මීට පෙර අවස්ථා කිහිපයකදී පියවර ගනු ලැබ ඇති නමුත් මෙතෙක් එම කාර්යය අවසන් වී නොමැත. මෙරට දේශීය ජල තීරය සහ මහ මුහුදේ නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර මෙහෙයුම් සම්බන්ධ ගැටලු පිළිබඳ ව්‍යාවස්ථාදායක රාමුව ශක්තිමත් කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික සහාය ද ඇතිව ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන් මෙන්ම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් මූලික කෙටුම්පතක් සකස් කරනු ලැබ ඇත. එකී මූලික කෙටුම්පත මත පදනම්ව නව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහාලුම් නිදහස් කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීම**

කොළඹ වරායේ පෞද්ගලික අංශය සතුව බහාලුම් පර්යන්ත 02ක් සහ රජය සතුව බහාලුම් පර්යන්ත 02ක් වශයෙන් බහාලුම් පර්යන්ත 04ක් ක්‍රියාත්මක වන අතර, ප්‍රති නැව්ගත කිරීම් නිෂ්කාශනය කිරීම ද ඇතුළුව

එක් පර්යන්තයක් හරහා දිනකට බහාලුම් 5,000-10,000 අතර ප්‍රමාණයක් පරීක්ෂා කර, නිදහස් කරනු ලබයි. රේගු නිලධාරීන් විසින් පිටකිරීමේ දොරටුවලදී පරීක්ෂා කිරීමට අවශ්‍ය බහාලුම් තීරණය කර, එම බහාලුම් භෞතික වශයෙන් පරිලෝකන පරීක්ෂාවට (Scan) ලක් කරනු ලබයි. පසුගිය කාලයේ නිෂ්කාශන ක්‍රියාවලිය තුළදී විවිධ ගැටලු මතුවීම හේතුවෙන් රේගු නිලධාරීන් විසින් දෛනිකව බහාලුම් වැඩි සංඛ්‍යාවක් පරීක්ෂාවට ලක් කොට ඇති අතර, වරාය වෙත පැමිණෙන නෞකා ප්‍රමාණයේ යම් වැඩිවීමක් ද නිරීක්ෂණය කර තිබේ. බහාලුම් නිදහස් කිරීම සඳහා දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයේ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කරමින් කිසිදු ප්‍රමාදයකින් තොරව වරායෙන් බහාලුම් නිදහස් කිරීම වෙනුවෙන් යෝග්‍ය ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීම**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී එස්. ආලෝකබණ්ඩාර මහතා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් කිරීමත් සමඟ එම තනතුර පුරප්පාඩු වී ඇත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පැවරී ඇති පුළුල් රාජකාරි විෂය පථය සැලකිල්ලට ගෙන, එම තනතුර සඳහා නිත්‍ය පදනමින් නිලධරයෙකු පත් කළ යුතුව තිබේ. ඒ අනුව, දැනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී එන්.යූ.එන්.මෙන්ඩිස් මහතා එකී තනතුරට පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරනු ලබන ඒ. ජගත් ඩී. ඩයස් මහතාගේ සේවා කාලය 2024-12-31 දින අවසන් වීමට නියමිත අතර 2025-01-01 දින සිට එකී තනතුරට සුදුසු නිලධාරියෙකු පත් කළ යුතුව ඇත. දැනට ත්‍රිකුණාමලය පරිපාලන

දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි වාමින්ද හෙට්ටිආරච්චි මහතා එම තනතුරට පත් කිරීම සඳහා සුදුසු බවට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ඒ මහතා 2025-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************